කසළ බැහැර කිරීමට නියමිත කරන ලද දින පවතී. කරුණාකර කසළ බැහැර කිරීමේ කැලැන්ඩරය පරීක්ෂා කරන්න. කරුණාකර නියමිත දිනයේ **උදෑසන 8:30 වන විට** ඔබේ කසළ, කසළ එකතු කරන ස්ථානයට දැමීමට කටයුතු කරන්න.
කසළ එකතු කිරීමේ ස්ථාන පරිශීලකයන් විසින් කළමනාකරණය කරනු ලබන බැවින් කරුණාකර භාවිතා කිරීමට පෙර එකතු කිරීමේ ස්ථානයේ පරිපාලකගෙන් විමසන්න.

සම්බු දිස්ත්‍රික් නාගරික පාරිසරික සනීපාරක්ෂක සංගමය
කසළ බැහැර කරන ආකාරය

කරුණාකර නීති වලට අනුකූලව සහ නිවැරදිව කසළ බැහැර කරන්න.

ඔබට නම් කරන ලද කසළ බැහැය ගැටගැසීමට නොහැකි අවස්ථාවක කරුණාකර විශාල කසළ නිවසින් එකතු කර ගැනීමට අයදුම් කිරීම හෝ කසළ එකතු කිරීමේ ස්ථානයට කෙලින්ම රැගෙන ඒම සිදු කරන්න.

කසළ නිවැරදි ආකරයට වර්ග කරමින් ඔබගේ සහයෝගය ලබා දෙන්න.

සීමිත සම්පත් සහ පෘථිවිය ආරක්ෂා කිරීම සඳහා

ඔබ මිලදී ගන්නා සමහර ප්ලාස්ටික් බෑග්, දහනය කල හැකි කසළ බැහැර කිරීමට භාවිතා කළ හැක.

සෙසිමියා මව්සුවෝ වෙළඳසැල, ලැන්ඩ් රෝම් ඩ්‍රග් මාර්කට් සන්ලි වෙළඳසැල
බිග් හවුස් සයකොෂිබා වෙළඳසැල

වෙබ් පිටුව
https://sankan.chiba.jp/wordpress/

කසළ වෙන් කිරීමේ පරිශීලකය
https://www.gomisaku.jp/0321/

කසළ වෙන් කිරීමේ යෙදුම (ios අනුවාදය)
https://perze.jp/app/0291/ios/

කසළ වෙන් කිරීමේ යෙදුම (Android අනුවාදය)
https://perze.jp/app/0291/android/

දහනය කල හැකි කසළ

- **මුළුතැන්ගෙයි අපද්‍රව්‍ය** [ඉවන දැමීමට පෙර ජලය මිරිකා හරින්න]
- **සම්(ලෙදර්) භාණ්ඩ** (සපත්තු, බෑග්, බද පටි ආදිය)

- **ප්ලාස්ටික් වර්ග** (සෙල්ලම් බඩු, ඇමිප්‍ර/සේදුම්කාරක සඳහා වන බහාලුම්, සීඩී/එම්ඩී ආදිය)
ප්ලාස්ටික් ටැංකි තුළ දැවෙන වායුව ඉතිරි වීමේ අවදානමක් ඇති බැවින් දහනය කළ නොහැකි කසළ ලෙස බැහැර කරන්න.

- **කඩදාසි වර්ග** (ඉවත දැමීය හැකි ඩයපර් වලින් අපද්‍රව්‍ය ඉවත් කරන්න)
- **රබර් වර්ග**

- **ලී භාණ්ඩ** [සෙන්ටිමීටර් 10ක් හෝ ඊට අඩු ඝනකමකට සහ දිග සෙන්ටිමීටර් 30ක් හෝ ඊට අඩුවෙන් කැබලිවලට කපන්න] (ලී පුවරු, කූරු, අතු ආදිය)
- **ස්ටයිරෝෆෝම්** [කුඩා කැබලිවලට කපා බැගයක දමන්න]

- **වෙනත්** (කුඩා කුෂන්, පිරවූ බෝනික්කන්, කපන ලද තණකොළ [පස ඉවත් කරන්න], සිගරට් කොට ආදිය)

සැ.යු
- ඇමිප්‍ර,සේදුම්කාරක යනාදිය බැහැර කිරීමට පෙර එහාගේ අන්තර්ගතය සියල්ල හාවිතා කරන්න.
- නිල් සීඩී ආදී විශාල වෑස්තුන් සෙන්ටිමීටර 30 ක් හෝ ඊට අඩු කැබලිවලට කපන්න.

ප්‍රතිචක්‍රීයකරණය කළ හැකි කසළ

*ලෙස සලකුණු කර ඇති වර්ගය අනුව කසළ වෙන් කර ඒවා වෙන් වෙන් වශයෙන් බෑග්වල දමන්න.
(ඉලක්ක අයිතම හැර අනෙකුත් අයිතම මිශ්‍ර කර ඇති අවස්ථාවල එම කසළ එකතු කරනු නොලැබේ.)

- **කෑන් සහ වීදුරු බෝතල් (මිශ්‍ර කළ හැක)**
  - ◇ කෑන්: බීම වර්ග, ඔධ්‍යසාර අඩංගු ඒවා පමණි.
  - ◇ වීදුරු බෝතල්: බීම වර්ග, ඔධ්‍යසාර, කුළුබඩු, ආහාර, ඖෂධ හෝ ආහාර පිසීමට ගන්නා තෙල් අඩංගු ඒවා පමණි.

*වීදුරු බෝතල් ළුඩි ඉවත් කළ යුතුය.
*කෑන් සහ වීදුරු බෝතල්වල අඩංගු ද්‍රව්‍ය ඉවත් කර ජලයෙන් සෝදා හරින්න.

සැ.යු: පළිබෝධනාශක බෝතල් බැහැර කළ නොහැක.
ටින් කළ භාණ්ඩ සහ රසකැවිලි ටින් දහනය කල නොහැකි කසළ ලෙස බැහැර කළ යුතුය.
රූපලාවණ්‍ය ද්‍රව්‍ය අඩංගු බෝතල් දහනය කළ නොහැකි කසළ ලෙස බැහැර කළ යුතුය.
බෝතල් ළුඩි → ලෝහමය ළුඩි දහනය කල නොහැකි කසළ ලෙස බැහැර කරන්න. / ප්ලාස්ටික් ළුඩි දහනය කල හැකි කසළ ලෙස බැහැර කරන්න.

- **ප්ලාස්ටික් බෝතල්**
  - ◇ **බීම වර්ග සහ කුළුබඩු** අඩංගු වූ ප්ලාස්ටික් බෝතල් පමණි.
  1. **PET සංදර්ශකය** සහිත විය යුතුය.
  2. ළුඩිය සහ ලේබලය ඉවත් කරන්න.
  3. අන්තර්ගතය ඉවත් කර ජලයෙන් සෝදන්න.

ඇමිප්‍ර සහ සේදුම්කාරක වැනි බහාලුම් දහනය කළ හැකි කසළ ලෙස බැහැර කරන්න.

ප්ලාස්ටික් බෝතල් බැහැර කරන ආකාරය
1) ජලයෙන් සෝදීම.
2) වෙන් කිරීම. බෝතල් ළුඩි සහ ලේබලය දහනය කළ හැකි කසළ ලෙස බැහැර කරන්න. ප්ලාස්ටික් බෝතල් ප්‍රතිචක්‍රීයකරණය කළ හැකි කසළ ලෙස බැහැර කරන්න.

- **ඇඳුම්**
නොත් නොවන ලෙස තබන්න.
(වැස්සට නොනෙමෙන ආකාරයට බෑගය හොඳින් ගැටගසන්න.)
*යට ඇඳුම්, මේස් සහ ඉරුණු ඇඳුම් දහනය කළ හැකි කසළ ලෙස බැහැර කරන්න.

- **වෙනත් රෙදි වර්ග**
නොත් නොවන ලෙස තබන්න.
(වැස්සට නොනෙමෙන ආකාරයට බෑගය හොඳින් ගැටගසන්න.)
*ඇඳ රෙදි, කර්ටන්, තුවා-බ්ලැන්කට් සහ *tanmono* පමණි.

- **සඟරා**
නොත් නොවන ලෙස තබන්න.
(වැස්සට නොනෙමෙන ආකාරයට බෑගය හොඳින් ගැටගසන්න.)
*පෙළපොත්, පොත් සහ ශබ්ද කෝෂ ද මේ සමග බැහැර කළ හැක.

- **පුවත්පත්**
නොත් නොවන ලෙස තබන්න.
(වැස්සට නොනෙමෙන ආකාරයට බෑගය හොඳින් ගැටගසන්න.)
*අත් පත්‍රිකා සහ දැන්වීම් පත්‍රිකා ද මේ සමග බැහැර කළ හැකිය.

- **කඩදාසි අසුරුම්**
පාන වර්ග අන්තර්ගත වූ කඩදාසි අසුරුම් පමණි.
අතුළත ජලයෙන් සෝදා හැර, අසුරුම් කපා විවෘත කර වියළන්න.
*අතුළත ඇලුමිනියම් සහිත අසුරුම් දහනය කළ හැකි කසළ ලෙස බැහැර කරන්න.



- **සුදු පැහැති ආහාර තැටි (සුදු පැහැති ෆොම්-ස්ටයිරෝෆෝම් මලින් සාදා ඇති) ආහාර තැටි** පමණි.
ජලයෙන් සෝදා, හොඳින් වියළන්න.
*තැටි මත වර්ණ, අක්ෂර ආදී රටා ඇත්නම් සහ පිරිසිදු කිරීමට අපහසු නම් ඒවා දහනය කළ හැකි කසළ ලෙස බැහැර කරන්න.



- **කාඩ්බෝඩ්**
නොත් නොවන ලෙස තබන්න.
(වැස්සට නොනෙමෙන ආකාරයට බෑගය හොඳින් ගැටගසන්න.)
*වැක්ස් වැනි ආලේපන ගල්වා ඇත්නම් දහනය කළ හැකි කසළ ලෙස බැහැර කරන්න
*ප්‍රමාණයෙන් විශාල ඒවා බෑගයේ ප්‍රමාණයට කපන්න.



දහනය කළ නොහැකි කසළ

*සලකුණේ සඳහන් කර ඇති ලෙස කසළ වර්ගීකරණය කර වෙන් වෙන් වශයෙන් බෑග්වලට දමන්න.
(කාණ්ඩයට අදාළ නොවන දේවල් බෑග්වල මිශ්‍ර වී ඇති අවස්ථාවල, ඒවා එකතු කරනු නොලැබේ.)

- **මැටි භාණ්ඩ සහ වීදුරු වර්ග** (ආහාර ගන්නා පාත්‍ර, පිඟාන්, මේස් බඳුන්, රූපලාවණ්‍ය ද්‍රව්‍ය අඩංගු බෝතල්, බීදුණු බෝතල්, ජනෙල් වීදුරු, වීදුරු කැබලි, කණ්ණාඩි, කොප්පර ආදිය)



*වීදුරු වැනි බිඳුණු ද්‍රව්‍ය අනතුරුදායක බැවින් බෑගයට දැමීමට පෙර කඩදාසියකින් ඔතන්න.

- **කුඩා ගෘහ උපකරණ** (සංගීත වාදක, රැකුම් කප්පිකර්, ස්ටීකර්, වීඩියෝ කැමරා, ඔරලෝසු,විදුලි කේතල් ආදිය)



*උපකරණවල ඇති පුද්ගලික තොරතුරු මකා දමන්න.

- **ලෝහ වර්ග සහ වෙනත්** (ගෑස් ලීප් මේසය , ගෑස් සිලින්ඩර්, ටින්කල් ආහාර බඳුන්, රසකැවිලි අන්තර්ගත වූ ටින්, භාජන, කේතල්, තුඩු, දිගු කිරීමේ රැහැන්, විදුලි රැහැන්, ප්ලාස්ටික් ටැංකි, වීඩියෝ පට, ස්ලේප් ටින්, බීලැන්කට්, කුෂන්, ජනෙළු, කොටිට ආදිය)

කුඩා කසළ බෑගයෙන් පිටතට වීන් තිබීම ගැටලුවක් නොවේ

*ගෑස් සිලින්ඩර් සහ රූපලාවණ්‍ය ද්‍රව්‍ය අඩංගු ඉෂිප් ටින් ආදිකෙහි අන්තර්ගතය අවසන් වන තුරු හාවිතා කර කසළ බෑගයට දමන්න.

සැ.යු
- ටින් කළ ආහාරවල අඩංගු ද්‍රව්‍ය දහනය කළ හැකි කසළ ලෙස බැහැර කරන්න.
- ඉතුරු වූ රූපලාවණ්‍ය ද්‍රව්‍යවල ගීති නොගන්නා දේවල් රෙදි පොඟවා එය දහනය කළ හැකි කසළ ලෙස බැහැර කරන්න.
- නම් කරන ලද කසළ බෑග්වලට දැමිය නොහැකි කසළ විශාල කසළ ලෙස සැලකේ.

අන්තරායක කසළ

- **භාවිතා කළ වියළි කෝෂ**
- **රසදිය උෂ්ණත්වමාන**

- **විදුලි බුබුළු , ප්‍රතිදීප්ත පහන්**

දිගු ප්‍රතිදීප්ත පහන් කසළ බාහිරයෙන් පිටතට පැමිණ තිබීම ගැටලුවක් නොවේ

*විදුලි බුබුළු සහ ප්‍රතිදීප්ත විදුලි පහන් කඩදාසියක ඔතා නියමිත බැග්වලට දැමිය යුතුය.

- **ජංගම බැටරි, ඉලෙක්ට්‍රොනික සිගරට්**

*ලෝහ හරියන්න කොටස් වෙස් හෝ වෙනත් ආකාරයකින් ඔතන්න.

- **ලයිටර්**

*ප්ලාස්ටික් බැහැර කිරීමට පෙර එහි අන්තර්ගතය ගිස් කරන්න.

- **නියුණු තල**

*කේපර් කටර් වල තල වීන් එකකට දමා බැහැර කරන්න.
*පිහි ආදිය සඳහා කලය වීමේ රෙදිදක් ඔතා 刃物 (හපොමොනො) ලෙස සටහන් කරන්න.

විශාල කසළ

නිවසට පැමිණ එකතු කර ගැනීමට අයදුම් කරන්න

අයදුම් කිරීම:
☎0479-86-3516

- කසළ එකතු කිරීමේ දින නියම කර ඇති බැවින් කරුණාකර කසළ බැහැර කිරීමේ දින දර්ශනය පරීක්ෂා කරන්න.
- සංගමයේ බල සීමාව තුළ ජීවත් වන අයට මෙම සේවාව හාවිතා කළ හැකිය.
- විශාල කසළ යනු නම් කරන ලද බෑග් වලට අදාළ නොවන කසළ වේ.
- ව්‍යාපාරික කටයුතුවලින් බැහැර කරනු ලබන කසළ මෙයට අදාළ නොවේ.

භාවිතය සඳහා උපදෙස්

1) අයදුම්පත (කසළ එකතු කරන දිනට පෙර දින දහවල් වන විට වෙන්කරවාගෙන තිබිය යුතුය.)
කරුණාකර දුරකථනයෙන් ඔබගේ ලිපිනය, නම, සම්බන්ධතා තොරතුරු සහ ඔබ බැහැර කරන අයිතමය සහ අයිතම ගණන දන්වන්න.

2) විශාල කසළ ස්ටිකර් මිලදී ගෙන ඒවා විශාල කසළවල අලවන්න.
එක් එක් අයිතමය සඳහා වෙන වෙනම ස්ටිකර් අලවිය යුතුය.
*විශාල කසළ ස්ටිකර්, කසළ බෑග් අලෙවිකරන වෙළඳසැල්වලින් මිලදී ගත හැකිය.

3) කරුණාකර ඔබේ කසළ, එකතු කරන දින උදෑසන 8:30 වන විට ඔබේ ගෙවත්ත වැනි පාරට පෙනෙන ස්ථානයකට දමන්න.
*කරුණාකර එකතු කිරීමට නම් කරන ලද අයිතමවලට අමතර දේවල් ඒ සමග බැහැර නොකරන්න.

කසළ කෙලින්ම සංගමයට රැගෙන ඒම

අයදුම් කිරීම: ☎0479-86-3516

- නම් කරන ලද කසළ බෑග් සහ විශාල කසළ ස්ටිකර් අවශ්‍ය නොවේ.
- ඔබගේ වාහනයේ කසළ ගොඩබෑමේ වගකීම ඔබ සතුය.කාර්යය මණ්ඩලයේ උපදෙස් පිළිපදින්න.
- ගෘහවල අතු ආදිය ඝනකම සෙන්ටිමීටර 10 ට වඩා අඩු , දිග මීටර් 1 ක් වීය යුතු අතර දිනකට වොන් 1 දක්වා එකතු කරනු ලැබේ. කරුණාකර නිල් ශීට් ආදිය රැගෙන ඒමට පෙර ඒවා සෙන්ටිමීටර 50ක ඝනයට මුලට කපා ගන්න.
- එක් දිනක් තුළ තනම් විශාල ප්‍රමාණයක් රැගෙන පැමිණෙන අවස්ථාවල, එයට සීමා පැනවීමට ඉඩ ඇත.
- කරුණාකර පවවන ලද අයිතම ඉක්මනින් වාහනයෙන් බාගැනීමට පහසු වන පරිදි ඒවා වෙන් කිරීමට කටයුතු කරන්න.
- මියගිය සුරනල් සතුන් ද රැගෙන යා හැකිය.

රැගෙන එන දිනය	සඳුදා සිට සිකුරාදා (ඔසර අවසානය,අලුත් අවුරුදු නිවාඩු සහ නිවාඩු දින හැර)	සෑම මසකම 2 වන සතියේ ඉරිදා දින
රැගෙන එන වේලාව	පෙ:ව 9 සිට 11 , ප:ව 1 සිට 4 දක්වා	පෙ:ව 9 සිට 11 *සවස් කලයේ රැගෙන යා නොහැක.
වෙන් කිරීම් සිදු කරන ආකාරය	පෙර දින දුරකථනයෙන් වෙන් කරවා ගැනීම අවශ්‍ය වේ. *පෙර දිනය වන්නේ ඉරිදා හෝ රජයේ නිවාඩු දිනයක් නම්, වහාම පෙර සෙනසුරාදා හැර සත්තේ දිනයකින් වෙන්කරවා ගැනීම සිදු කරන්න.	සඳුදා සිට සිකුරාදා දක්වා (නිවාඩු දින හැර) දුරකතනයෙන් කලින් වෙන් කර ගත යුතුය. *සති 2කට පෙර සිට වෙන් කර ගත හැක.
ගාස්තු	*කසළ බැහැර කිරීම: කිලෝ ග්‍රෑම් 10 කට යෙන් 100 (කිලෝ ග්‍රෑම් 10 ට අඩු වුවද යෙන් 100) *මියගිය සුරනල් සතුන්, මළ සිරුරකට යෙන් 500	

*විශාල කසළ, හෝ එකවර බැහැර කිරීම සඳහා කසළ විශාල ප්‍රමාණයක් තිබේ නම්, එය කෙලින්ම සංගමයට රැගෙන යා හැකිය.
*අවිවාර්යයෙන්ම කසළ නියමිත ලෙස වෙන් කර රැගෙන ඒමට.

ගෘහ උපකරණවල ප්‍රතිචක්‍රීකරණය කිරීමේ නීතියට යටත් අයිතම

*සංගමය මගින් එකතු කළ නොහැක.

•ගෘහ උපකරණ ප්‍රතිචක්‍රීකරණය කිරීමේ නීතිය 2001 අප්‍රේල් 1 දින සිට බලාත්මක වූ අතර, එමගින් **වායු සමීකරණ, රූපවාහිනී, ශීතකරණ, අධිශීතකරණ, රෙදි සෝදන යන්ත්‍ර සහ රෙදි වියළන යන්ත්‍ර** ප්‍රතිචක්‍රීකරණය කිරීම අනිවාර්ය කරන ලදී.
(ඒවා කසළ එකතු කරන ස්ථානයකට බැහැර කිරීමට හෝ සංගමයට රැගෙන යාමට නොහැකිය.)



ප්‍රතිචක්‍රීයකරණය සිදු කරන ආකාරය

•කරුණාකර පහත කුමවේදීව් රැකුමයක් භාවිතා කරන්න.
1 වන කුමය : ඔබ අයිතමේ භාණ්ඩය මිලදී ගත් වෙළඳසැලෙන් හෝ ඔබ නව භාණ්ඩයක් මිලදී ගන්නා වෙළඳසැලෙන් එය රැගෙන යා මෙන් ඉල්ලුම් කරන්න.
2 වන කුමය : සැසැස් කාර්යාලයේ ප්‍රතිචක්‍රීකරණ ගාස්තුව ගෙවීමෙන් පසු, අයිතමය සෘජුව නිකමින එකතු කරන ස්ථානයට ප්‍රවාහනය කරන්න
3 වන කුමය : සංගමය විසින් ඔපසතුරන් වෙළඳ සමාගමක් ඉල්ලා සිටින්න. (කරුණාකාර ගාස්තු ආදිය සඳහා ඔපසතුරාණී වෙළඳ සමාගම සම්බන්ධ කරගන්න.)

ඔපසතුරාණී වෙළඳ සමාගම:
~~Shinko Sangyo ☎ 0479 (86) 5769~~ Gendai Kogyo ☎ 0479 (74) 7887

නම් කරන ලද එකතු කිරීමේ ස්ථාන	~~Eco-mine, 604-5 Tokura, Tomisato City, ☎ 0476 (94) 0959~~ Nippon Express, 1-8-7 Osaku, Sakura City, ☎ 043 (498) 0856 Nanso Transport Mobara Branch, 1193-1 Yamanne, Nagara-machi, Chosei District, ☎ 0475 (30) 7333

ප්‍රතිචක්‍රීකරණ යොමු ගාස්තුව (ප්‍රතිචක්‍රීකරණ ගාස්තුව නිෂ්පදනය අනුව වෙනස් වේ.)					
වායු සමීකරණ	රූපවාහිනී (අඟල් 15 හෝ ඊට අඩු)	රූපවාහිනී (අඟල් 16 හෝ ඊට වැඩි)	ශීතකරණ, අධිශීතකරණ (170ℓ හෝ ඊට අඩු)	ශීතකරණ, අධිශීතකරණ (171ℓ හෝ ඊට වැඩි)	රෙදි සෝදන යන්ත්‍ර රෙදි වියළන යන්ත්‍ර
ඒකකයක් යෙන් 990 සිට	ඒකකයක් යෙන් 1320 සිට	ඒකකයක් යෙන් 2420 සිට	ඒකකයක් යෙන් 3740 සිට	ඒකකයක් යෙන් 4730 සිට	ඒකකයක් යෙන් 2530 සිට

වැඩිදුර විස්තර

ප්‍රතිචක්‍රීකරණ ගාස්තු හෝ ගෘහ උපකරණ ප්‍රතිචක්‍රීකරණ නීතියට යටත් වේද යන්න පිළිබඳව ඔබට ගැටලු පවතී නම්, කරුණාකර ගෘහ උපකරණ සංගමයේ ගෘහ උපකරණ ප්‍රතිචක්‍රීකරණ වගුවර්ග මධ්‍යස්ථානය (☎ 0120-319-640) අමතන්න.
වෙබ් පිටුව: https://r.ic.aeha.or.jp

සංගමයට විසින් එකතු නොකරන කසළ

*කරුණාකර විශේෂඥ සමාගමක් සම්බන්ධ කරගන්න.

කෘෂිකාර්මික ද්‍රව්‍ය (කෘෂිකාර්මික වයිනයිල්, විශාල කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ, පළිබෝධනාශක, පළිබෝධනාශක බහාලුම්, රසායනික බහාලුම්) , ගෑස් සිලින්ඩර්, වාහන අමතර කොටස්, වාහන තෙල්, බැටරි, ටයර්, ඇළු, ගිනි නිවන උපකරණ, විශාල වාණිජ විදුලි උපකරණ, තීන්ත, ඝිරේන්ජර, සිරින්ජර කටු, පියානෝ, ඉදිකිරීම් අපද්‍රව්‍ය, ගඩොල්, උළු, පෙට්ටි, ඩීසල්, භූමිතෙල්, 50cc ට වැඩි යතුරුපෑදූ, පස්, කොන්ක්‍රීට්, පරිගණක ආදිය.

කසළ සැකසුම් පහසුකම
සම්බු දිස්ත්‍රික් නාගරික පාරිසරික සනීපාරක්ෂක සංගමය
1149-1 Kanno, Matsuo-machi, Sammu City ☎ 0479-86-3516 පිළිගැනීමේ වේලාවන් 8:30-17:15

කසළ රැගෙන ඒමේ දිනය: සඳුදා සිට සිකුරාදා (නිවාඩු දින හැර)
කසළ රැගෙන ඒමේ වේලාව 9:00-11:00, 13:00-16:00
කසළ රැගෙන ඒමේ දිනය: 2 වන ඉරිදා කසළ රැගෙන ඒමේ වේලාව 9:00-11:00

ඉලස්ට්‍රේෂන් මූලාශ්‍ර: 経済産業省ウェブサイト https://www.meti.go.jp
日本容器包装リサイクル協会

කසළ බැහැර කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණු

කරුණාකර දහනය කළ හැකි කසළ, දහනය කළ හැකි කසළ එකතු කරන ස්ථානයට සහ දහනය කළ නොහැකි, ප්‍රතිචක්‍රීකරණය කළ හැකි සහ අනතුරුදායක කසළ, දහනය කළ නොහැකි කසළ එකතු කරන ස්ථානයට බැහැර කරන්න.
දහනය කළ නොහැකි, ප්‍රතිචක්‍රීකරණය කළ හැකි සහ අනතුරුදායක කසළ විර්ග අනුව එකතු කරනු ලැබේ, එබැවින් කසළ එකතු කිරීම සම්පූර්ණ කිරීමට දින කිහිපයක් ගත විය හැකිය.
දහනය කළ හැකි සහ දහනය කළ නොහැකි කසළ එකතු කිරීමේ මධ්‍යස්ථාන වෙනස් විය හැකි බව කරුණාවෙන් සලකන්න.
සුළිසුලං හෝ අධික හිම වැනි කාලගුණික තත්ත්වයන් හේතුවෙන් කසළ එකතු කිරීම කළ නොහැකි විය හැක.